## 13 ශ්‍රේණිය ව්‍යාපාර සංඛ්‍යානය 2 වන සතිය - මැයි 11 සිට 15 දක්වා

## ආර්ථක දර්ශක නිමානය කිරීමට චල මධ්‍යක ක්‍රමය භාවිත කිරීම

### චල මධ්‍යක ක්‍රමය

- කාලශ්‍රේණි දත්තයන්හි ඇති උපනති,චාක්‍රික හා අක්‍රමවත් චලන පියවරින් පියවර ඉවත් කොට ආර්ථව චලන ඉස්මතු කර ගන්නා ක්‍රමයක් ලෙසට චල මධ්‍යක ක්‍රමය සඳහන් කළ හැකිය.

- කාලශ්‍රේණි දත්ත (Y)හි චල මධ්‍යක හෝ කේන්ද්‍රික චල මධ්‍යක ගැනීමෙන් කාලශ්‍රේණියේ ආර්ථව හා අක්‍රමවත් චලන ඉවත් වී උපනතිය හා චාක්‍රික චලන පමණක් ඉතිරි වේ.මුල් දත්ත,චල මධ්‍යකයන්ගෙන් බෙදූවිට ආර්ථව හා අක්‍රමවත් චලන පමණක් ඉතිරි වේ.අනුරූප කාර්තුවල මධ්‍යනා‍ය ගණනය කිරීමෙන් අක්‍රමවත් චලන ඉවත් වී ආර්ථව චලන පමණක් ඉතිරි වේ යයි බලාපොරොත්තු වීම චල මධ්‍යක ක්‍රමය පදනම් කර ගෙන ආර්ථව දර්ශකය ගණනය කිරීමේ තාර්කික පදනමයි.

- කාලශ්‍රේණියක ආර්ථව චලනයන්හි රටා නොවෙනස්ව පවතින විට ඒවා මැනීම සඳහා අන් ක්‍රමයන්ට වඩා හොඳ දර්ශකයක් චල මධ්‍යක ක්‍රමය මගින් ලබා දේ.

- චල මධ්‍යක ක්‍රමයට කාර්තුමය ආර්ථව දර්ශක ගණනය කිරීමේ පියවර පහත දැක්වේ.

  1.එක් එක් වර්ෂයේ කාර්තුමය දත්ත (Y) එකිනෙකට පහළින් අනුයාත ලෙස පිහිටන සේ කාල ශ්‍රේණිය සිරස්ව දැක්වීම.
  2.කාලශ්‍රේණිය සඳහා මාත්‍රය 4 වන චල මධ්‍යකයන් ගණනය කර ඒවායෙහි මාත්‍රය 2 වන කේන්ද්‍රික චල මධ්‍යක ලබා ගැනීම.
  3.කාලශ්‍රේණි අගයන්(Y) අනුරූප චල මධ්‍යක අගයන්ගේ ප්‍රතිශතයක් ලෙස ගණනය කිරීම.
  4.ඉහත තුන්වන පියවරෙන් ලබා ගත් ප්‍රතිශත කාර්තුමය වශයෙන්වෙන් කර ගෙන කාර්තු හතර සඳහා ප්‍රතිශතයන්ගේ මධ්‍යනා‍ය ගණනය කිරීම.
  5.හතරවන පියවරෙන් ලද ප්‍රතිශත මධ්‍යනා‍යයන්ගේ එකතුව 400ට සමාන නොවන්නේ නම් 400ට සමාන වන සේ ගැලපුම් සිදු කිරීම.

  1.ආර්ථව දර්ශක ගණනය කිරීම සඳහා චල මධ්‍යක ක්‍රමයෙහි ඇති යහපත් ලක්ෂණ 2ක් ලියන්න.

  2. ආර්ථව දර්ශක ගණනය කිරීම සඳහා චල මධ්‍යක ක්‍රමයෙහි ඇති අයහපත් ලක්ෂණ 2ක් ලියන්න.